# 11 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 10 පාඩම

## ශ්‍රීමත් අයිවර් ජෙනිංගස්

බප/මිනු/කඳන්ගමුව ම.වි.

මිනුවන්ගොඩ කලාපය

G.G. ඉරෝෂනී පුෂ්ප කුමාරි මිය

# ශ්‍රීමත් අයිවර් ජෙනිංගස්




පහත වැදගත් කරුණු මතක තබාගන්න.

- ශ්‍රීමත් අයිවර් ජෙනිංගස් මහතා බ්‍රිතාන්‍ය ජාතිකයෙකි.
- ඔහු ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නිර්මාතෘවරයා ය.

- එවක මෙරට පැවැති යුනිවර්සිටි කොලීජියේ ප්‍රධානාචාර්ය ලෙස රජය විසින් ඔහු පත්කර එය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීමේ කාර්ය එතුමා වෙත පැවරීය.



- පේරාදෙණිය සරසවිය අලංකාර ගොඩනැගිල්ලක් පමණක් නොව කලාත්මක පරිසරයකින් හෙබි ස්ථානයක් බවට ඔහු පත් කළේය.





- සිංහල සාහිත්‍යයේත් නාට්‍ය කලාවේත් විශිෂ්ට නිර්මාණ බිහිවීමටත් ජාත්‍යන්තර වශයෙන් පවා සම්මානයට පාත්‍ර වූ ශාස්ත්‍ර ගවේෂණ හා ප්‍රකාශන එළි දැක්වීමටත් එතුමා ක්‍රියාත්මක කළ නේවාසික විශ්වවිද්‍යාල සංකල්පය හේතුවිය.



- විශ්වවිද්‍යාලය සඳහා චිත්‍ර ප්‍රදර්ශනයක් සහිත කෞතුකාගාරයක් ද ඔහු සැලසුම් කළේය.



- ආර්ථික අගහිඟකම් ඇති අයට එතුමා ශිෂ්‍යත්ව ක්‍රමයක් පිහිටුවීය.

- ඔහු විසින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මෙරටට සම්පාදනය කළේය.

- පකිස්තානය, මැලේසියාව, ඝානාව, ගයානාව, නේපාලය සහ මාලදිවයින රාජ්‍යයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය වූයේ ඔහුගේ උපදෙස් අනුවය.


- ඔහු විසින් වැදගත් ග්‍රන්ථද රචනා කර ඇත.
- වසර 14 ක පමණ ඔහු ශ්‍රී ලංකාවේ රැඳී සිටියේය.
- කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය විසින් එහි ට්‍රිනටි හෝල් ආයතනයේ ප්‍රධානත්වයද ඔහු වෙත පැවරීය.



- රැජිනගේ නීතිඥ මෙන්ම බ්‍රිනාත්‍ය අධිරාජ්‍යයේ නයිට් පදවියද විශ්වවිද්‍යාල ගණනාවකින් ආචාර්ය උපාධියද ඔහුට පිරිනැමිණ.



# ඔහුගේ ස්වයං චරිතාපදානය
# THE ROAD TO PERADENIYA
# (පේරාදෙණියට මාවත නම් විය)



- දැන් පෙළපොතේ පාඩම හොඳින් කියවන්න.

- ඉහත කරුණුද මතකයේ රඳවා ගනිමින් මෙම පාඩමට අයත් අවබෝධය, ලිඛිත අභ්‍යාසය සහ ප්‍රායෝගික අභ්‍යාස කරන්න.



# සියළු දෙනාටම සුභ අනාගතයක් .....